රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 23/2020

මගේ අංකය : EST- 6/04/LON/0207
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.12.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2021 වසර

2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ 2015 වර්ෂය යන්න වෙනුවට 2020 වර්ෂය යන්න ආදේශ කිරීමට සහ 2016 වර්ෂය ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම 2021 වර්ෂය යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2021 වර්ෂයට රු. 4,000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2021.01.01 දිනෙන් ආරම්භ කර 2021.02.28 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2021.02.28 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතු ය. මෙම අත්තිකාරම් මුදල 2021 වර්ෂය තුළදීම අයකර අවසන් කළ යුතු ය.

04. 2020.03.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020හි විධිවිධාන අනුව අය නොකළ රජයේ නිලධරයන්ට 2020 වර්ෂයේ දී ලබාදුන් විශේෂ අත්තිකාරම් මුදලෙහි අප්‍රේල් සහ මැයි මස වාරික මුදල් 2021 වර්ෂයේ වාරිකවලට එකතු කර එම වර්ෂය තුළදීම අයකර අවසන් කළ යුතු ය.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය